# ව්‍යවසායකත්ව අධ්‍යයනය

## විස්තරාත්මක විෂය නිර්දේශය

11 වන ශ්‍රේණි×

(2008 සිට ක්‍රියාත්මක වේ.)

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව

විද්‍යා හා තාක්ෂණ පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# හැඳින්වීම

ජ්‍යෙෂ්ඨ, ද්විතියික ශ්‍රේණි සඳහා තාක්ෂණික විෂය ධාරාව යටතේ අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පැවති ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂය සෙසු තාක්ෂණික විෂයයන් අතර, ඉහළ ජනප්‍රියත්වයක් තිබූ විෂයයක් විය. ද්විතීයික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා ලබා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනය විසින් සංවිධානය කරන ලද ජාතික සම්මන්ත්‍රණයේ වාර්තාවෙහි ව්‍යවසායකත්ව අධ්‍යයන පාඨමාලාවක අවශ්‍යතාව පෙන්වා දී ඇත. එසේ ම ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ උපදේශක වාර්තාව මඟින් ද ශ්‍රේණි 10 සහ 11 සඳහා ව්‍යවසායකත්ව විෂයමාලාවක අවශ්‍යතාව නිර්දේශ කර ඇත. ජාතික අධ්‍යාපන ආයතනයේ ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද විෂයමාලා සමීක්ෂණයක අනාවරණ අනුව ද ව්‍යවසායකත්ව පාඨමාලාවක අවශ්‍යතාව තහවුරු විය. අධ්‍යාපන අමාත්‍යාංශයේ ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (SEMP) උපදේශක වාර්තාව (2004 නොවැම්බර්) මඟින් ද ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන විෂයය වෙනුවට ව්‍යවසායකත්වය නමින් විෂයයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදි. එසේ ම විවිධ තලයන්හි පාඨමාලාවන්වල ව්‍යවසායකත්ව විෂයමාලාව ජනප්‍රිය වීමේ ප්‍රවණතාවක් ද දක්නට ලැබේ.

ඉහත කී සාධක සැලකිල්ලට ගෙන කාලීන සහ අනාගත අවශ්‍යතාවන්ට උචිත වන අයුරින් මෙම විෂය නිර්දේශය සංවර්ධනය කර ඇති අතර, එය 2007 වර්ෂයේ සිට හඳුන්වාදීමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වෛකල්පිත විෂයයක් වශයෙන් ක්‍රියාත්මක වීමට නියමිතය. පැවති ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන විෂය නිර්දේශය සංශෝධනයට ලක් කිරීමේ දී ව්‍යවසායකත්ව විෂය ක්ෂේත්‍රය කෙරෙහි ප්‍රමුඛතාවක් ලබා දෙන ලදි. ඒ අනුව 2007 වර්ෂයේ සිට මෙම විෂය නිර්දේශය ව්‍යවසායකත්ව අධ්‍යයනය නමින් ක්‍රියාත්මක වීමට නියමිතව ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ බොහෝ දෙනා ව්‍යාපාර කිරීම සඳහා පෙළඹී ඇත්තේ ව්‍යාපාර පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් ලබා නොව, ඔවුනගේ උරුමය, විරුකියාව හෝ තමාගේ ම ව්‍යාපාරයක් කිරීමට ඇති ආසාව නිසා ය. නමුත් මෙම විෂයය තුළින් ව්‍යාපාර කටයුතු සඳහා යොමු වන්නෙකුට ඊට සුදුසු මූලික දැනුම, කුසලතා හා ධනාත්මක ආකල්ප හිමි කර දෙන අතර, ව්‍යාපාර ආරම්භ කිරීමට වඩාත් හොඳ පදනමක් ද ලබා දෙනු ඇත.

මෙම විෂයය හුදෙක් න්‍යායාත්මක කරුණු උගන්වන විෂයයකට සීමා නොවී ශිෂ්‍යයාට ව්‍යාපාරික ලෝකය තුළ හැසිරෙමින් ව්‍යවසායකත්වය පිළිබඳ සැබෑ අත්දැකීම් ලබා දෙන්නා වූ විෂයයක් බවට පත් විය යුතු ය.

ශ්‍රී ලංකාවේ අර්ථ ක්‍රමය තුළ වඩාත් වැදගත් වන ව්‍යාපාර අංශයක් වන කුඩා ව්‍යාපාර පිළිබඳව ද මෙම විෂයයේ දී අවධානයට ලක් වී ඇත. බොහෝ අය කුඩා ව්‍යාපාර කෙරෙහි නැඹුරු වූවත්, ඒවා ඵලදායීව පවත්වා ගෙන යාමක් හෝ ඒ සඳහා සපයා ඇති සානුබලයන් නිසියාකාරව භුක්ති විඳීමක් හෝ නොවෙන බව පෙනෙන්නට තිබේ. මෙම විෂය නිර්දේශය සැලසුම් කිරීමේ දී මේ පිළිබඳව ද අවධානයට ලක් විය.

ශිෂ්‍යයන් තුළ ව්‍යාපාර පිළිබඳ සුභවාදී ආකල්පය හා නිපුණතා ඇති කර, ඒ තුළින් සාර්ථක ව්‍යවසායකයින් ව්‍යාපාර ලෝකයට දායාද කිරීමත්, ව්‍යාපාර පිබිදීමක් තුළින් තිරසාර ආර්ථික

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

සංවර්ධනයක් ඇති කිරීමත් ව්‍යාවසායකත්ව අධ්‍යයන විෂයය හඳුන්වාදීම තුළින් අපේක්ෂා කෙරේ. මෙම විෂයයෙහි දැක්ම වනුයේ ව්‍යවසායකත්වය පිළිබඳ ඇල්මක් ඇති ශිෂ්‍ය ප්‍රජාවක් බිහිකිරීම තුළින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ක්ෂේත්‍රයේ උන්නතියට දායකවීම ය.

## විෂය නිර්දේශයේ අරමුණු

1. සමාජයීය හා ආර්ථික සංවර්ධනයට දායක වන්නා වූ ව්‍යවසායකත්ව ප්‍රජාවක් බිහි කිරීම.
2. ව්‍යාපාර කිරීමේ දී සැලැස්මක් ඇතිව ප්‍රවිෂ්ඨවීමට සැලැස්වීම.
3. ගතික පරිසරය තුළ ව්‍යාපාර සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය කෙරෙන නිපුණතා ගොඩනැගීම.
4. ව්‍යවසායකත්ව වෘත්තීය මාවත කෙරෙහි නැඹුරු කිරීම.
5. ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ වැඩිදුරටත් අඛණ්ඩව අධ්‍යයනයේ යෙදීමට පෙළඹවීම.
6. ව්‍යාපාර කිරීම සඳහා ඇල්මක් ඇති කිරීම.
7. සම්පත් කළමනාකරණයට යොමු කිරීම.
8. සමාජයීය වගකීම් සහ ආචාර ධර්ම පිළිපදින්නාවූ ව්‍යාපාර ප්‍රජාවක් නිර්මාණය කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 6. ව්‍යාපාර අවස්ථා ගවේෂණය කරයි. | | 06 |
| 6.1 ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම සඳහා ව්‍යාපාර පරිසරයේ ප්‍රවණතා විශ්ලේෂණය කරයි. | • ව්‍යාපාර පරිසරය හා ප්‍රවණතා<br>• අභ්‍යන්තර<br>• බාහිර<br>• දේශපාලන හා නෛතික<br>• ආර්ථික හා ප්‍රජා<br>• සමාජයීය හා සංස්කෘතික<br>• විද්‍යාත්මක හා තාක්ෂණික<br>• ස්වභාවික හා භූගෝලීය | |
| 6.2 හොඳ ව්‍යාපාර අවස්ථා තෝරා ගැනීම සඳහා ව්‍යාපාර අවස්ථා විශ්ලේෂණය කරයි. | • ව්‍යාපාර අවස්ථා<br>• ව්‍යාපාර අවස්ථා සංකල්පය<br>• ව්‍යාපාර අදහස සහ ව්‍යාපාර අවස්ථා අතර වෙනස<br>• හොඳ ව්‍යාපාර අවස්ථාවන්හි ලක්ෂණ<br>• ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම හා ඇගයීම | |
| 7. පාරිභෝගිකයා තෘප්තිමත් කෙරෙන සාධක විමර්ශනය කරයි. | | 18 |
| 7.1 පාරිභෝගික හැසිරීම් කෙරෙහි බලපාන සාධක අනාවරණය කරයි. | • පාරිභෝගික හැසිරීම කෙරෙහි බලපාන සාධක<br>• මිල<br>• සමාජ තත්ත්වය<br>• රුචිය<br>• ආදායම<br>• ප්‍රවර්ධනය<br>• පාරිභෝගික සේවා<br>• අනෙකුත් නිෂ්පාදිත<br>• සමජාතීය<br>• අනුපූරක | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 7.2 පාරිභෝගිකයා තේරීම සඳහා වෙළෙඳපොළ විමර්ශනය කරයි. | • පාරිභෝගික ඉලක්කකරණය<br>• වෙළෙඳපොළ සමීක්ෂණ<br>• වෙළෙඳපොළ ඛණ්ඩනය<br>• ඉලක්ක වෙළෙඳපොළ<br>• වෙළෙඳපොළ හිදැස | |
| 7.3 පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට නිෂ්පාදිත සැලසුම් කරයි. | • නිෂ්පාදිත<br>• හර නිෂ්පාදිතය හා නිෂ්පාදිත මට්ටම්<br>• ප්‍රමාණය<br>• ගුණත්වය<br>• සන්නම හා වෙළෙඳ ලකුණ<br>• ඇසුරුම<br>• අනෙකුත් ගුණාංග | |
| 7.4 නිෂ්පාදිතය සඳහා යෝග්‍ය මිල තීරණය කරයි. | • නිෂ්පාදිතයක් මිල කිරීම<br>• මිල කිරීමේ දී සලකා බැලිය යුතු සාධක<br>• මිල කිරීමේ පරමාර්ථ<br>• මිල කිරීමේ ක්‍රම<br>• ලකුණු කළ මිල<br>• ඉලක්ක - ඉපයුම් මිල<br>• පවත්නා මිල | |
| 7.5 නිෂ්පාදිතය සඳහා යෝග්‍ය බෙදාහැරීම් මාර්ග තෝරයි. | • බෙදාහැරීමේ මාර්ග<br>• ඍජු<br>• වක්‍ර<br>• සිල්ලර<br>• තොග<br>• යෝග්‍ය බෙදාහැරීම් මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| 7.6 නිෂ්පාදිතය සඳහා යෝග්‍ය ප්‍රවර්ධන ක්‍රම තෝරා ගැනීමට ප්‍රවර්ධන මිශ්‍රය විශ්ලේෂණය කරයි. | • ප්‍රවර්ධන මිශ්‍රය<br>• ප්‍රචාරණය<br>• විකුණුම් ප්‍රවර්ධනය<br>• පෞද්ගලික විකුණුම්<br>• සෘජු අලෙවිකරණය<br>• මහජන සම්බන්ධතා<br>• ප්‍රවර්ධන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක | |
| 8.යෝග්‍ය සංවිධාන වර්ගය තේරීම සඳහා ව්‍යාපාර සංවිධාන වර්ග විශ්ලේෂණය කරයි.<br>8.1 හිමිකාරත්ව පදනම මත ව්‍යාපාර සංවිධාන වර්ග කරයි. | • ව්‍යාපාර සංවිධාන වර්ග<br>• පෞද්ගලික අංශය<br>• කේවල ස්වාමි<br>• හවුල්<br>• සීමා සහිත සමාගම්<br>• සමුපකාර සමිති<br>• රාජ්‍ය අංශය<br>• දෙපාර්තමේන්තු<br>• සංස්ථා<br>• සීමා සහිත සමාගම්<br>• අවිධිමත් සංවිධාන | 09 |
| 8.2 ව්‍යාපාර අදහසට යෝග්‍ය වන ව්‍යාපාර සංවිධාන වර්ගය තෝරයි. | • තෝරා ගැනීමේ තීර්ණායක<br>• ව්‍යාපාරයේ ප්‍රමාණය<br>• ව්‍යාපාරයේ ස්වභාවය<br>• නෛතික අවශ්‍යතා<br>• වගකීම<br>• කළමනාකරණය/ පාලන තරා තිරම<br>• අඛණ්ඩතාව/ නෛතික පැවැත්ම<br>• ප්‍රාග්ධන අවශ්‍යතාව<br>• ස්වකීය කැමැත්ත | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 8.3 ව්‍යාපාර සංවිධාන ආරම්භ කිරීමේ දී අනුගමනය කළ යුතු නෛතික තත්ත්වය අනාවරණය කරයි. | • ආරම්භ කිරීමේ ක්‍රියාපටිපාටිය<br>  • ලියාපදිංචි කිරීම<br>  • ලිපිලේඛන කටයුතු | |
| 9. ව්‍යාපාර සැලැස්මක මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට උපකාර කර ගැනීම සඳහා ගිණුම්කරණයේ පදනම ගවේෂණය කරයි. | • ගිණුම්කරණයේ කාර්යභාරය | 12 |
| 9.1 ගනුදෙනු ව්‍යාපාරයක වත්කම්, වගකීම් හා හිමිකම්වලට ඇති කරන බලපෑම විග්‍රහ කරයි. | • ගිණුම්කරණ සමීකරණය<br>  • වත්කම්, වගකීම්, හිමිකම්<br>  • ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට ඇති කරන බලපෑම<br>• ගනුදෙනුවක ද්විත්ව බලපෑම | |
| 9.2 ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ව්‍යාපාරයක ලාභය හා මූල්‍ය තත්ත්වය අනාවරණය කරයි. | • ආදායම් ප්‍රකාශය<br>  • ආදායම<br>  • වියදම<br>• ශේෂ පත්‍රය<br>  • වත්කම්<br>  • වගකීම්<br>  • හිමිකම් | |
| 9.3 ව්‍යාපාරයක මුදලින් හා ණයට සිදුවන ගනුදෙනු වාර්තාකරණය අනාවරණය කරයි. | • ගනුදෙනු වාර්තා කරන මූලික පොත් හා මූලාශ්‍ර ලේඛන<br>  • මූලාශ්‍ර ලේඛන<br>  • මුදල් පොත<br>  • විකුණුම් පොත<br>  • ගැණුම් පොත | |
| 10. ව්‍යාපාර අදහසක් ක්‍රියාත්මක කිරීමේ පූර්ව සූදානමක් ලෙස ව්‍යාපාර සැලැස්ම පිළියෙල කරයි.<br>10.1 ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ පෙර සූදානම ප්‍රදර්ශනය කරයි. | • ව්‍යාපාර සැලසුම සඳහා අවශ්‍යතාව<br>  • ව්‍යාපාර සැලසුම් සංකල්පය<br>  • ව්‍යාපාර සැලසුමක වැදගත්කම<br>  • ව්‍යාපාර සැලසුමක ආකෘතිය | 36 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 10.2 ව්‍යාපාර අදහස පිළිබඳ ව විස්තර සංක්ෂිප්තව ඉදිරිපත් කරයි. | • සංක්ෂිප්ත විස්තරයක ඇතුළත් තොරතුරු<br>• ව්‍යාපාර අදහස<br>• නිෂ්පාදිතය<br>• තෝරා ගැනීම සඳහා පෙළඹීම<br>• පාරිභෝගිකයා<br>• වෙළෙඳපොළ<br>• භූගෝලීය ප්‍රදේශය<br>• තරඟකරුවන්<br>• වෙළෙඳපොළ කොටස<br>• නිෂ්පාදිතය<br>• මිල<br>• ස්ථානය<br>• ප්‍රවර්ධනය<br>• නෛතික තත්ත්වයන් | |
| 10.3 ව්‍යාපාරය සඳහා වූ නිෂ්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ පෙර සූදානම ප්‍රදර්ශනය කරයි. | • මෙහෙයුම් තොරතුරු<br>• නිෂ්පාදන ක්‍රියාවලිය<br>• නිෂ්පාදන ක්‍රම<br>• තාක්ෂණය<br>• පිරියත<br>• අමුද්‍රව්‍ය හා උපකරණ<br>• ශ්‍රමය<br>• ගබඩා හා තොග<br>• තත්ව පාලනය | |
| 10.4 නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු කරයි. | • නිෂ්පාදන පිරිවැය<br>• ඍජු පිරිවැය<br>• ද්‍රව්‍ය<br>• ශ්‍රමය<br>• වෙනත්<br>• වක්‍ර පිරිවැය<br>• ද්‍රව්‍ය<br>• ශ්‍රමය<br>• වෙනත් | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 10.5 ව්‍යාපාරය සඳහා මානව සම්පත් සැලසුම පිළියෙල කරයි. | • කාර්ය මණ්ඩල අවශ්‍යතාව<br>• තනතුරු<br>• කාර්ය<br>• වගකීම<br>• සුදුසුකම්<br>• සංවිධාන ව්‍යුහය | |
| 10.6 ව්‍යාපාරය සඳහා ස්ථාවර ආරම්භක ප්‍රාග්ධනය ඇස්තමේන්තු කරයි. | • ආයෝජනය<br>• ඉඩම්<br>• ගොඩනැගිලි<br>• උපකරණ<br>• විවිධ | |
| 10.7 ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය ඇස්තමේන්තු කරයි. | • කාරක ප්‍රාග්ධනය<br>• කාර්ය මණ්ඩල පිරිවැය<br>• මෙහෙයුම් පිරිවැය | |
| 10.8 ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධන මූලාශ්‍ර විශ්ලේෂණය කරයි. | • මූල්‍යන මූලාශ්‍ර<br>• හිමිකරු ප්‍රාග්ධනය<br>• ණය | |
| 10.9 ව්‍යාපාරයේ මාසික විකුණුම් ඇස්තමේන්තු කරයි. | • සෑම නිෂ්පාදනයක් සඳහා විකුණුම්<br>• ප්‍රමාණය<br>• මිල<br>• පිරිවැටුම | |
| 10.10 ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහ සැලසුම පිළියෙල කරයි. | • එන මුදල්<br>• හිමිකාරත්ව<br>• ණය<br>• විකුණුම්<br>• අනෙකුත්<br><br>• යන මුදල්<br>• ආයෝජනය<br>• මෙහෙයුම් පිරිවැය<br>• පොලිය<br>• අනෙකුත්<br><br>• අතැති මුදල්<br>• මුදල් ගිණුම | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 10.11 ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ඇස්තමේන්තු කරයි. | • ඇස්තමේන්තුගත ශුද්ධ ලාභය<br>• මුළු විකුණුම්<br>• මුළු පිරිවැය<br>• බදු පෙර ලාභය<br>• බදු පසු ලාභය | |
| 10.12 ව්‍යාපාරයේ ශේෂ පත්‍රය පිළියෙල කරයි. | • වත්කම්<br>• ස්ථාවර<br>• ජංගම<br>• මුළු වත්කම්<br><br>• වගකීම්<br>• හිමිකාරත්ව<br>• දිගුකාලීන වගකීම්<br>• ජංගම වගකීම්<br>• මුළු වගකීම් | |
| 11. ව්‍යාපාර දිරිගැන්වීම සඳහා ඇති උපකාර වැඩසටහන්වලින් ඵල ප්‍රයෝජන ලබා ගැනීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.<br>11.1 ව්‍යාපාර දිරිගැන්වීමට ආධාර කරන්නා වූ උපකාරක වැඩසටහන් අනාවරණය කරයි. | • ව්‍යාපාර සඳහා උපකාරක වැඩසටහන්<br>• ක්ෂුද්‍ර පරිමාණ<br>• කුඩා පරිමාණ<br>• මධ්‍යම පරිමාණ<br><br>• උපකාර විධි<br>• මූල්‍යමය<br>• මූල්‍යමය නොවන<br><br>• ව්‍යාපාරවල මූලික අදියර හා ලබාගත හැකි උපකාරක<br>• ආරම්භ කිරීමට පෙර<br>• ආරම්භක අදියර | 09 |
| 11.2 ව්‍යාපාර ක්‍රියාත්මක වන විවිධ අදියරවල දී ලබා ගත හැකි උපකාර විශ්ලේෂණය කරයි. | • ව්‍යාපාර ක්‍රියාත්මක වන අදියර හා ලබා ගත හැකි සේවා | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 11.3 ලබාගත හැකි උපකාරවලට ප්‍රවිෂ්ඨවීම සඳහා ක්‍රියාමාර්ග ගනියි. | • මූල්‍යමය පහසුකම්වලට ප්‍රවේශවීම<br>• නිවැරදි පුද්ගලයන් හා ආයතන<br>• මූලික අවශ්‍යතා<br>• ලිපිලේඛන කටයුතු<br><br>• මූල්‍යමය නොවන පහසුකම්වලට ප්‍රවේශවීම<br>• නිවැරදි පුද්ගලයන් හා ආයතන<br>• මූලික අවශ්‍යතා<br>• ලිපිලේඛන කටයුතු | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය**

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දි ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (TRANSMISSION ROLE) හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANSACTION ROLE) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත් එය සිදු විය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු-සිසු අන්තර් ක්‍රියා ද පසු ව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයෙකුගේ (RESOURCE PERSON) තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (TRANSFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විස්තරාත්මක විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමු වන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම / පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම / ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය / දෙබස්, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන (DEMONSTRATIONS) ඍජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION) සඳහා සිසුනට අවස්ථාව ලබා දීමටය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදවු වීම, කාල කළමනාකරණය,

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුනට හැකියාව ලැබේ.
සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකි සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ 3 වන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම් සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායකය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයාගැනීම් වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාටය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත් සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුකරණය හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ 2 පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESSMENT), ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුකරණය හා ඇගයීම පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

**ගුණාත්මක යෙදවුම්**

- වැඩ පොත්
- පාඨ ග්‍රන්ථ
- පාඨමාලා අත්පොත්
- ව්‍යාපාර සැලසුම් පිළිබඳ ආදර්ශ ආකෘති
- ලිපිද්‍රව්‍ය
- අධ්‍යාපන තාක්ෂණික ඉගෙනුම් ආධාරක
- ව්‍යවසායකයින් පිළිබඳ පළවී ඇති ප්‍රකාශන
- සැබෑ ව්‍යාපාර සැලසුම්

**තක්සේරුව හා ඇගයීම**

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව වත් ලබා ගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරු කිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (FEED BACK) හා ඉදිරිපෝෂණය (FEED FORWARD) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (STUDENT-CENTRED), නිපුණතා පාදක (COMPETENCY-BASED) ක්‍රියාකාරකම් දිශානුගත (ACTIVITY-ORIENTED) කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (TRANSFORMATION ROLE) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරුකරණයටත් ක්‍රියාකාරකම්වල තුන් වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශි වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩ නැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.
තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මුලින්ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන්කර ගැනීමයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කර ගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කෙරෙන උපකරණ සකසා ගැනීම ඊළඟ පියවර වන අතර සැම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ක්‍රියාකාරකම් කාණ්ඩයක් ආරම්භයේ දී ම මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යයි. මේ අනුව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක් වේ.

- සංකල්ප සිතියම් (CONCEPT MAPS)
- බිත්ති පුවත්පත් (WALL NEWS PAPERS)
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් (QUIZZES)
- ප්‍රශ්න සහ පිළිතුරු පොත් (QUESTION AND ANSWER BOOKS)
- ශිෂ්‍යය කාර්ය සාධන ගොනු (PORTFOLIOS)
- සිසු නිර්මාණ ප්‍රදර්ශන (EXHIBITIONS)
- විවාද (DEBATES)
- සාකච්ඡා මණ්ඩල (PANEL DISCUSSIONS)
- සම්මන්ත්‍රණ (SEMINARS)
- ක්ෂණික කථා (IMPROMPTU SPEECHES)
- භූමිකා රංගන (ROLE PLAYS)
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම (PRESENTATION OF LITERATURE REVIEWS)
- ක්ෂේත්‍ර පොත් / ස්වභාව අධ්‍යයන දින පොත් / හොඳ වැඩ පොත් (FIELD BOOKS/ NATURE DIARIES)
- ප්‍රායෝගික පරීක්ෂණ (PRACTICAL TESTS)

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරා ගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැළසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ඇගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකි වේ.

**පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය**

න්‍යායාත්මකව ඉගෙන ගන්නා විෂයය කරුණුවල ප්‍රායෝගික ව්‍යවහාරයන් පිළිබඳ ව අත්දැකීම් ලබාදීම, අපේක්ෂිත නිපුණතා වඩාත් ඵලදායීව වර්ධනය කිරීම සහ විෂය කෙරෙහි ඇල්මක් ඇති කිරීම ආදිය සඳහා පාසල් තුළ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් කීපයක් යෝජනා කළ හැකි ය. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් ප්‍රතිපත්ති සකස් කර ගැනීම වැදගත් ය. මෙම ප්‍රතිපත්තිවලින් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් පාසල් වාර්ෂික වැඩසටහනට ඇතුළත් කර ගැනීම යෝග්‍ය වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ව්‍යවසායකත්ව සමාජ පිහිටුවීම.
- වෙළෙඳපොළවල් පැවැත්වීම.
- වාණිජමය ව්‍යාපෘති ඇරඹීම හා ඒ සඳහා සුදුසු සංවිධාන පිහිටුවීම.
- අලෙවි කළ හැකි ස්වයං නිර්මාණ ප්‍රදර්ශනය.
- ව්‍යාපාර සාකච්ඡා මණ්ඩල (ව්‍යාපාර සමුළු) හා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- ව්‍යාපාර ව්‍යාපෘතිවලට අදාළ ව ජාල සම්බන්ධතා ගොඩනගා ගැනීම.
- ව්‍යවසායකත්ව සම්මාන උළෙලක් සංවිධානය කිරීම.
- අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු රැස් කිරීම.
- ව්‍යවසායකයින්ගේ ජීවන කතා එක්රැස් කිරීම හා සාකච්ඡා කිරීම.
- යම් යම් නිෂ්පාදිත නිපදවා අලෙවි කිරීමට සැලැස්වීම.
- සෙසු තාක්ෂණික විෂයයන් උගන්වන ගුරුවරු සහ විෂයයන් ඉගෙන ගන්නා සිසුන් අතර ඵලදායි සම්බන්ධතා ගොඩනැගීම.
- ස්වකීය සැබෑ ව්‍යාපාරයක් සඳහා වූ ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීම හා එය මූල්‍ය ආයතන සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.